





"..නැහැ තාත්තා.. මට දැන් සනීපයි.. අම්මලා බය වෙන්න එපා.. මට දැන් හොඳයිනේ.. ඔයාල කරදර වෙන්න එපා.."අමන්දි පහත් හඬින් කීවාය..

0000000000

අමන්දිගේ අසනීපයත් සමගින් තමාගේ සුපුරුදු දින චර්යාව ද වෙනස් වී ඇතැයි නිමන්තට සිතෙයි. දින ගණනාවකින් පෞද්ගලික ඊමේලයක් කියවන්නටවත්, නෑදෑ හිතවතුන් සමග සම්බන්ධ වන්නටවත් ඔහුට හිතක් නොවීය. දරාගත නොහැකි තරමේ පීඩාවක් ඔහුට දැනෙයි. ටික දවසකට කොහේ හෝ නිවාඩුවකට යන්නට ඇත්නම් එය අමන්දිට ද වෙනසක් වේ යැයි නිමන්ත කල්පනා කළේය.

නිමන්ත පසුගිය දින කීපයේම උත්සාහ කළේ විශ්වජිත් බණ්ඩාර හමුවන්නට ය. අමන්දි වෙනුවෙන් ඔහු ඉදිරියේ බැගෑපත් වන්නට නිමන්ත සූදානම්ව සිටියේ ය. නිමන්ත කීපවතාවක්ම ඔහු හා දුරකතනයෙන් කතා කරන්නට උත්සාහ කළත් එය සාර්ථක නොවීම ඔහුගේ සිතේ කෝපයක් ද ඇති කළේ ය.

කීප වතාවක්ම සුනෙත් හමුවූ නමුදු විශ්වජිත් බණ්ඩාර හමුවිය හැකි ආකාරයක් සොයා ගන්නට නිමන්ත නොහැකි විය.

"සර් සාමාන්‍යයෙන් ගුප්ත මනුස්සයෙක්.. එක අතකින් එයා තාපසයෙක් වගේ.. තමන්ගෙ ගුහාවටම වෙලා භාවනා කරමින් ඉන්න තාපසයෙක් වගේ.. බාහිර ලෝකය එක්ක ලොකු සම්බන්ධතාවක් ගොඩනගා ගෙන ඉන්න එයා කැමති නැහැ.. නිරීක්ෂකයෙක්.. සමාජය එක්ක ගැටෙන්නෙ ගැලපෙන්නෙ නැතිව ඈත ඉඳන් නිරීක්ෂණය කරන කෙනෙක්.." සුනෙත් කී හැටි නිමන්තට මතකය.

"මේ කලාකාරයොයි කියන එවුන් ඔක්කොටම පිස්සු.." නිමන්ත සිතුවේ ය.

එයින් සතියකට පසු සුනෙත් නිමන්ත හමුවන්නට ආවේ වෙනස්ම ආරංචියක් රැගෙන ය.

"සර් ඊයෙ හවස රට ගිහින්.. ආයෙ එන්නෙ කවදද කියල කවුරුවත් දන්නෙ නෑ"

00000

විශ්වජිත් බණ්ඩාර හදිසියේ විදෙස්ගත වූ බව අමන්දිට නොකියා සිටින්නට නිමන්ත තීරණය කළේ ය. ඒ එම ආරංචිය අමන්දි ගේ සතුටට හේතු නොවනු ඇතැයි ඔහු සිතූ බැවිනි.

විශ්වජිත් බණ්ඩාර හදිසියේ විදෙස්ගත නොවුණා නම් ඔහුට අමන්දි පිළිබඳ සියල්ල පවසා ඇයට චිත්‍ර ශිල්පය ඉගැන්වීමට ඔහු පොළඹවා ගන්නට තමාට හැකිවන්නට ඉඩ තිබුණ බව නිමන්ත දනියි. අවම වශයෙන් අනුකම්පාවට හෝ විශ්වජිත් තමාගේ ඉල්ලීමට එකඟවන්නට ඉඩ තිබුණි.

කිසිවක් තමන්ට අවශ්‍ය ආකාරයට සිදුනොවීම සිතට වදයකි. අමන්දිගේ අසනීපය පමණක් නොව ඒ හා සමගාමීව ඇය තමන් වෙතින් ඈත්ව යමින් සිටීම ද ඔහුගේ සිතේ ඇති කළේ මහත් පීඩාවකි. ඇගේ ජීවිතය පමණක් නොව තමාගේ ජීවිතයද අවුල්ව යමින් තිබෙන බව නිමන්තට දැනෙයි. හිත එකලස් කරගෙන වැඩ කරන්නට නොහැකි බවක් නිමන්තට දැනුණි. තමා මේ සිදුවීම් මාලාවෙන් හෙම්බත්ව ඇති බවක් ඔහුට දැනෙයි. මේ ආකාරයට දිගටම ඉදිරියට යාම කළ නොහැකි දෙයකි. විවේකය-ක් ගත යුතු බව සිත කියයි.

ඔහුට තම පාසැල් සගයෙකු වූ අජන්ත සිහිවූයේ කල්පනාවේ නිමග්නව සිටිද්දී හදි-සියේම ය. වැඩිදුර අධ්‍යාපනයත් ලබන්නට විදෙස් ගත වූ අජන්ත රැකියාවක් ලැබ, විවාහ වී පැරිසියේ ජීවත් වෙයි. නිවාඩුවක් ගත කිරීම සඳහා පැරිසියට එන්නැයි අජන්ත වරින් වර කරන ආරාධනය නිමන්තට සිහිපත් විය. මේ තාක් කාලයක් විවිධ හේතු දක්වමින් ප්‍රතික්ෂෙප කළ ඒ ආරාධනාව සළකා බලන්නට මෙය සුදුසුම අවස්ථාව නොවේ ද? වෙනසක් සඳහා විදෙස් ගත වීම අමන්දිගේ පවා සිතට සහනයක්



ලැබ දෙනු ඇතැනි නිමන්ත සිතුවේ ය.

0000000

පැරිසියට යාම සඳහා නිමන්ත කළ යෝජනාව අමන්දි අසා සිටියේ මහත් අපහසුවෙනි.

"පිස්සුද..?" ඇය ඔහුගෙන් ඇසුවේ එපමණකි.

**".. ප්‍රශ්න ඇතුළට වෙලා දුක් විඳින්න එපා.. පොඩ්ඩක් හිත නිදහස් කරගන්න බලන්න.. ඒක ඔයාට විතරක් නෙවෙයි.. ඔයාට ආදරේ කරන හැමෝටම හොඳයි.. "**



ඇයට අවශ්‍යව තිබුණේ පරිබාහිර ලෝකයෙන් ගැළවී ඇගේ කාමරය තුළ ගුලි වී සිටින්නට පමණකි ය. තැන තැන නිවාඩු ගත කරන්නටවත් ජීවත්වන කිසිවකු දකින්නටවත් ඇගේ සිතේ කැමැත්තක් නොවී ය. මේ සකළවිධ හැළහැප්පීම් වලින් වියුක්තව සැඟව සිටින විට දැනෙන සහනය කොයි තරම් ද? ජීවිතයට අලුතින් දේ එකතු කරගන්නට අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ එක්කරගෙන තිබෙන සියල්ල පවා ජීවිතයෙන් ඉවත් කර ගන්නටය. මේ දරමින් සිටින්නේ ලෝබයෙන් එක්ක කරගත් සියල්ල එකින් එක ඉවත් කර ගැනීමේ වේදනාව නොවේ ද..?

අලුතින් අද්දැකීම් අවශ්‍ය නැත. තිබෙන බර පොදියට තවත් බර එක්ක ගන්නට ඇවැසි නැත. ඇය ඔහුගේ යෝජනාව එක හෙළා ප්‍රතික්ෂෙප කළේ එනිසා ය.

"අනේ මට කරදර කරන්න එපා.." අමන්දි අයැද සිටියා ය. ඔහු අප්‍රසාදයෙන් හිස ගැස්සුවේ ය. ඇගේ ප්‍රතික්ෂෙප කිරීම නිමන්ත ගේ සිතේ ඇති කළේ කෝපයකි

"අමා.. ඔයාට නිවාඩුවක් ඕනෙ නැතිව ඇති.. ඒත් මට නිවාඩුවක් ඕනෙ.. මං මේවායින් හෙම්බත් වෙලා ඉන්නෙ.. දෙයියන්ගෙ නාමෙන් තේරුම් ගන්න.."

අමන්දි හැඟීම් විරහිතව ඔහු දෙස බලා සිටියා විනා කිසිවක් නොකීවා ය. හෙට සුනෙත් හමුවිය යුතු යයි ඈ ඒ අතර සිතුවා ය. තවත් වතාවක් විශ්වජිත් හමුවිය යුතු යයි ද ඔහු හා කතා කළ යුතු යයිද ඇය සිතුවා ය.

000000

"විශ්වජිත් සර් ආයෙ කවදා එයිද දන්නෙ නැහැ මිස්.." සුනෙත් තමා ඉදිරිපිට මේසය මත වූ වීදුරුවේ දාරය මත දබරැඟිල්ල යවමින් කීවේ ය. ".. එයා එක්ක කොයි තරම් කතා කළත් එයා කවදාවත් කිව්ව වචනයක් වෙනස් කරන කෙනෙ-ක් නෙවෙයි.."

"එයා මහ අමුතු මිනිහෙක් තමයි" විශ්වජිත්ගේ අකරුණාවන්ත හැසිරීම අමන්දිට සිහිපත් වෙයි. "..ඔව්... කිසිම කරුණාවක් හදවතේ නැති රළු මිනිහෙක්.. එහෙම හැඟීම් විරහිත මිනිහෙකුට හොඳ කලාකාරයෙක් වෙන්න පුළුවන්ද සුනෙත්..?"

"නෑ මිස්.. එහෙම කියන්න බැහැ.. එයා ගැන එහෙම තක්සේරුවක් කරන්න එපා.. එයා කියන්න තියෙන දේ කෙළින් කියන කෙනෙක්.. හිතේ එකක් තියාගෙන බොරුවට වෙනින් යමක් කියන්නෙ නැහැ.. එයා එකඟ වෙන්නෙ නැත්නම් මිස්ට තියෙන්නෙ වෙනින් මාස්ටර් කෙනෙක්ගෙන් ඉගෙන ගන්න.. අපේ සර් දිහා බලා ඉඳලා තේරුමක් නැහැ මිස්.."

"මට දැන් ඒ ගැන කිසිම උනන්දුවක් නැහැ සුනෙත්.. මට දැන් හැම දේම එපා වෙලා තියෙන්න.. කිසිම දේක තේරුමක් නැහැ.." අමන්දි සුසුමක් හෙලුවා ය.

සුනෙත් කිසිවක් නොකියා වීදුරුව දෙසම නෙත් යොමා සිටියේ ය. ඇගේ කළකිරීම ඔහුට තේරුම් ගත හැකිය. ඈ විශ්වජිත් හමුවන්නට ගියේ කොපමණ කැමැත්තෙන්ද යන්න ඔහු හොඳින් දැන සිටියේය.

"මට හිතෙන්න මිස් නිමන්ත සර් කියනවා වගේ නිවාඩුවකට ගියොත් හොඳයි කියලයි.. මේ දැනෙන කළකිරීම් වලින් පොඩ්ඩක් ඈත් වෙලා හිත නිදහස් කරගන්න මිස්ට පුලුවන් වෙයි.. අනික පැරිසිය හරිම ලස්සන නගරයක් කියලා මං අහලා තියෙනවා.. ඒ පරිසරයෙදි මිස්ට සහනයක් ලැබෙයි.."

අමන්දි සිනාසුණා ය. සුනෙත් හමුවන්නට එන්නට පෙර මිලින්ද හා චතුරි හමුවූ මොහොතේ ඔවුන් කීවේද මේ කතාව ම ය.

"විවේකය කියන්නෙ හොඳ ඔසුවක් අක්කා.." මිලින්ද කී හැටි ඇයට සිහිපත් වෙයි. ".. ප්‍රශ්න ඇතුළට වෙලා දුක් විඳින්න එපා.. පොඩ්ඩක් හිත නිදහස් කරගන්න බලන්න.. ඒක ඔයාට විතරක් නෙවෙයි.. ඔයාට ආදරේ කරන හැමෝටම හොඳයි.. නිමන්ත අයියට අම්මට තාත්තට චතුරිට මට.. අපි ඔක්කොටම ඕනෙ ඔයා සතුටින් ඉන්නවා දකින්න.."

"මහ ලොකු කාලයකට නෙවෙයිනෙ අක්කා.. ඔයා යන්න.. මිලින්ද ඩොක්ටර් සිරිමාන්න එක්කත් කතා කරලා තියෙනවා.. එයත් කියන්නෙ ඔයාට මේ වෙලාවෙ විවේකයක් ලැබෙන එක හොඳයි කියලයි.."

"ඔව් අක්කා.. මං ඩොක්ටර් සිරිමාන්න එක්කත් කතා කළා .එයා කියන්නෙත් මේක මේ වෙලාවෙ කරන්න පුළුවන් හොඳම දෙයක් කියලයි.. එයා දන්නවා ඔයා ඕනවටත් වඩා අසනීපෙ ගැන හිතනවා කියලා.. හිත ලෙඩ වුණාම කොහොමත් ලෙඩ වැඩි වෙනවනේ.. ඒ නිසා මේ වෙලාවෙ වෙන්න ඕන හිත සතුටින් ඉන්න පුළුවන් පරිසරයක් හදලා දෙන එක තමයි .. වෙනස් පරිසරයකට ගියාම හිතත් වෙනස් වෙනවනේ.. අපි ඩොක්ටර් සිරිමාන්නව හම්බ වෙලා ට්‍රීට්මන්ට්ස් ගැන කතා කර ගමු.. ඒක ප්‍රශ්නයක් වෙන්නෙ නෑ.."

"මිස්... මේ නිවාඩුව අරගන්න.." සුනෙත් අමන්දිගේ සිතුවිලි දැහැන බිඳ දමමින් කියයි. දවසේ පළමු වතාවට අමන්දිගේ සිතට සහනයක් දැනෙයි. ඇගේ මුවේ ඇඳෙන සිනාව ඒ බව පවසයි.

"එහෙනං මං නිමන්තට හා කියන්නම්කො.." අමන්දි කියයි.

ලබන කලාපයට